මස්කෙළිය ප්‍රාදේශීය සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 අප්‍රේල් 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ මූල්‍ය ප්‍රකාශන 2019 මැයි 19 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දිනද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 මැයි 29 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් මාස 09 සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව වෙත මධ්‍යම පළාත් සභාවෙන් පවරා ඇති කාර් රථය සභාවට පවරාගෙන නොතිබුණි. | වාහනය සභාවට පවරා ගෙන වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. | 2019 වර්ෂයේදී පවරාගෙන මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කිරීමට කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම්

නීති ,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති ,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ වාර්ෂික සමීක්ෂණයක් සිදු කළ යුතු වේ. | ඉදිරියේදී සමීක්ෂණය කිරීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | වරිපනම් බදු සඳහා දේපළ තක්සේරුව 2010 වර්ෂයට පසුව සිදුකර නොතිබුණි. | වරිපනම් බදු සඳහා දේපළ තක්සේරුව කළ යුතු වේ. | ඉදිරියේදී තක්සේරු කිරීමට කටයුතු කරමී. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස නවය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,561,162 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

2018 අප්‍රේල් 01 දින ස්ථාපිත කර තිබූ සභාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස නවයක කාල පරිච්ඡේදය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

2018

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 4,980,000 | 2,630,061 | 1,990,272 | 2,087,370 |
| කුලී | 7,010,000 | 9,230,220 | 8,599,575 | 2,099,165 |
| බලපත්‍ර ගාස්තු | 1,350,000 | 870,473 | 870,473 | - |
| වෙනත් ආදායම් | 3,690,000 | - | 7,538,626 | - |
| එකතුව | 17,030,000 | 12,730,754 | 18,998,946 | 4,186,535 |

2.2.1 කුලී.

-----

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට පැවති රු.1,450,000 ක හිඟ මස් කඩ කුලී අයකර ගැනීමට කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි . | හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ . | හිඟ මුදල් කොටස් වශයෙන් අය කරමින් පවතින අතර කොටසක් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු ආරම්භ කර ඇත.. |

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1. කාර්ය සාධනය

-------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කාර්තවයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ කාරණා 30 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු කාරණාවක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. එසේම ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථා වැළඳගැනීම සඳහා සභා තීරණයන්ගෙන තිබුණද එය ගැසට්පත්‍රයේ පළකර නොතිබුණි. | අදාළ අතුරු ව්‍යවස්ථාව ගැසට් පත්‍රයේ පළ කර ක්‍රියාත්ම කිරීමට කටයුතු කළ යුතුවේ . | ඉදිරි මාසය තුළ ගැසට් කිරීමට කටයුතු කරමි. |

(ආ) ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය 2018 ඔක්තෝබර් 04 දින සිට වසා දමා තිබුණි. | කඩිනමින් සේවාව සැපයීම ආරම්භ කළ යුතුවේ. | පළාත් පාලන කොමසාරිස් මඟින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත වෛද්‍යවරයෙකු ලබාදෙන ලෙස ඉල්ලීමක් කර ඇත. |

(ඇ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුවේ . | ඉදිරි වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කරමි. |

(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (i) | කසල ජනනය වන ස්ථානයේදීම කැලි කසල කළමනාකරණය කර ගැනීම දිරි ගැන්වීම සඳහා ප්‍රදේශයේ ජනතාව වෙත බෙදා දීමට සභාවට ලැබී තිබුණු කොම්පෝස්ට් බඳුන් 43 ක් මාස 3 කට වැඩි කාලයක් ගබඩාවේ රඳවාගෙන තිබුණි. | කොම්පෝස්ට් බඳුන් කඩිනමින් බෙදා දීමට කටයුතු කළ යුතුවේ . | බල ප්‍රදේශය තුළ පිහිටි රාජ්‍ය ආයතන, පාසල් සහ බැංකු සඳහා බෙදා දීමට කටයුතු කරමින් පවතී. |
| (ii) | සභාව දෛනිකව එකතු කරන වර්ග නොකරන ලද මිශ්‍ර කසළ මධ්‍යස්ථාන භූමියේදී පස්දමා වැසීම සිදු කිරීම නිසා අවට පිහිටි පයිනස් ශාක විනාශ වී ඇති අතර කසල මධ්‍යස්ථානයේ අපජලය ස්වභාවික පරිසරයට එකතුවෙමින් පැවතුණි. | පරිසර හානියක් නොවන ආකාරයට කසළ කළමනාකරණය කළ යුතු වේ. | දැනට කසළ වෙන් කර ලබාගන්නා අතර අප ජලය ස්වාභාවික පරිසරයට එක් වීම වැළැක්වීම සඳහා ක්‍රියාමර්ග ගනිමින් පවතී. |

| | | |
|---|---|---|
| (iii) වැසිකිළි අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා 2016 වර්ෂයේදී රු.1,376,267 ක වියදමක් දරා නිමකර තිබුණු පද්ධතියේ ඉදිකිරීම් කටයුතු අවසන්කර භාවිතයට නොගැනීම නිසා එම ඉදිකිරීම් නිෂ්කාර්යව පැවතුණු අතර, වැසිකිළි අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමට එය බාධාවක් වී තිබුණි. | මෙම ව්‍යාපෘතියේ කටයුතු නිම කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුවේ. | සභා අනුමැතියෙන් පසු ඇස්තමේන්තු සකස් කර වැඩ නිම කිරීමට අපේක්ෂිතය. |

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිළිබඳව ප්‍රාදේශීය සභාව ප්‍රමාණවත්ව දැනුවත්වී නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුළදී ඒ සම්බන්ධයෙන් නිශ්චිත කාර්යයන් ඉටුකර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී තිරසර සංවර්ධන හා ඉලක්ක සපුරා ගැනීම සඳහා කටයුතු කළ යුතු වේ . | ඉදිරි වර්ෂයේදී කටයුතු කරමී. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

(අ) සේවක පුරප්පාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සඳහා කළමනාකරණ දෙපාර්තමේන්තුව 2018 පෙබරවාරි 26 හා මැයි 17 දින අනුමතකළ කාර්ය මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දින වන විට තනතුරු 20ක පුරප්පාඩු 79 ක් පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරමින් පවතී. |

(ආ) සේවක ඇප

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මු.රෙ.880 හා 2003 අප්‍රේල් 11 දිනැති අංක සීපීසී/සීඑස්/06/06/02 දරන මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබාගෙන නොතිබුණි. | අදාළ වගකීම් ඉටු කරන ලද නිළධාරීන්ගෙන් ඇප තැන්පත් ලබාගැනීමට කටයුතු කළ යුතු වේ . | ඉදිරියේදී මේ සම්බන්ධව කටයුතු කරමි. |

3 වත්කම් කළමණාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අඹගමුව ප්‍රාදේශීය සභාවෙන් පවරාදී තිබුණු ඉඩම් කැබලි 35 ට අදාළ ඔප්පු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | සභාවට ඉඩම් පවරාගෙන ඔප්පු ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉඩම් විධිමත් ලෙස පවරා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. |

3.4 වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| i. සභාවට අයත් කැබ් රථය 2018 දෙසැම්බර් 31 දින සිට හා ට්‍රැක්ටර් රථය 2018 මැයි මාසයේ සිට අලුත්වැඩියා කටයුතු සඳහා ධාවනයෙන් ඉවත්කර තිබුණු අතර, 2018 නොවැම්බර් 14 දින වන විටද අදාළ අලුත්වැඩියා කටයුතු ආරම්භකර නොතිබුණි. | කඩිනමින් අළුත්වැඩියා කටයුතු සිදු කරවාගෙන ධාවනයේ යෙදවීමට කටයුතු කළ යුතුවේ. | පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය ලද පසුව අළුත්වැඩියාව සිදු කිරීමට කටයුතු කරමී. |

3.5 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 භාණ්ඩ සමීක්ෂණයේදී අනාවරණය වී තිබුණු අස්ථානගත වූ රු.74,208 ක් වටිනා පොත් 414 සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | අවශ්‍ය කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී පැවැත්වීම විගණන හා කළමනාකරණ කමිටුවේ තීරණය ලබාගෙන නිවැරදි කිරීමට කටයුතු කරමි. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1. අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 193 අනුව අයවැයගත මූල්‍ය ප්‍රතිපාදන සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සිදු වී තිබෙන වෙනස්වීම් පිළිබඳව කරුණු පැහැදිලි කිරීමේ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ රීති ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී එවැනි ප්‍රකාශයක් ඉදිරිපත් කරමි. |

4.2. අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතු වේ. | නිළධාරීන්ගේ පුරප්පාඩු පැවති නිසා අභ්‍යන්තර විගණනය සිදු කළ නොහැකි වූ අතර ඉදිරියේදී මෙම විෂය සඳහා නිළධාරියෙකු යෙදවීමට කටයුතු කරමි. |

4.3 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුව එක් වරක් පමණක් පවත්වා තිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු නියමිත පරිදි පැවැත්විය යුතු වේ. | ඉදිරියේදී නියමිත පරිදි පැවැත්වීමට කටයුතු කරමි |